# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2441/14 - 2025 ජුනි මස 18 වැනි බදාදා - 2025.06.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

22 වන වගන්තිය යටතේ වන නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මා විසින්, මෙම නියමය මගින්,

i. 2021 පෙබරවාරි මස 03 වැනි දිනැති අංක 2213/36 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළකරන ලද, 2021 අංක 3 දරන නියෝගවල උපලේඛනයේ I කොටසෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ විගාමිකයෙක් විසින් ආරම්භක සංක්‍රමණික දීමනාව යටතේ සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ.ඩො. 100,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සීමා කරනු ලැබේ.

ii. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/34 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළකරන ලද, 2021 අංක 1 දරන නියෝගවල (මෙහි මින්මතු "2021 අංක 1 දරන නියෝග" වශයෙන් හඳුන්වනු ලබන) උපලේඛනයේ I කොටසෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙක් විසින් විදේශයන්හි ආයෝජන සිදු කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා සිදු කරන පහත දක්වා ඇති ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටවනු ලැබේ.

(අ) පහත සඳහන් සුදුසුකම්ලත් ආයෝජකයන් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම්වල (ආයෝජිත සමාගම්) සාමාන්‍ය කොටස්වල සිදු කරනු ලබන ආයෝජන:

i. ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් (ආයෝජක සමාගම්) එ.ජ.ඩො. 750,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා හෝ ආසන්නතම මූල්‍ය වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ආයෝජක සමාගමේ ශුද්ධ වත්කම්වලින් 20% කට සමාන හෝ එයට අඩු ප්‍රමාණයක් යන ප්‍රමාණවලින් කුමන හෝ අඩු ප්‍රමාණය දක්වා, හෝ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ii. ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොකළ සමාගම් (ආයෝජක සමාගම්) එ.ජ.ඩො. 200,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා හෝ ආසන්නතම මූල්‍ය වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ආයෝජක සමාගමේ ශුද්ධ වත්කම්වලින් 20% කට සමාන හෝ එයට අඩු ප්‍රමාණයක් යන ප්‍රමාණවලින් කුමන හෝ අඩු ප්‍රමාණය දක්වා

(ආ) ආයෝජක සමාගම විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් විදේශ මුදලින් ලබා ගන්නා ලද අවසරලත් විදේශ ණය මුදලකින් අදාළ විදේශ ආයෝජනය සම්පූර්ණයෙන්ම මූල්‍යනය කිරීමට යටත් ව, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක (ආයෝජිත සමාගම) සාමාන්‍ය කොටස්වල සිදු කරන ලබන ආයෝජන

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින්, කල්පිරීමේ කාලය අවම වශයෙන් වර්ෂ හතක් (7) වූ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත ආයෝජක සමාගම නිකුත් කරන ලද ණය සුරැකුම්පත්වල හෝ එම සමාගමේ කොටස්වල සිදුකරනු ලබන ආයෝජනවලින් ලද අරමුදල් වලින් අදාළ විදේශ ආයෝජනය සම්පූර්ණයෙන් ම මූල්‍යනය කිරීමට යටත් ව, එම ආයෝජක සමාගම විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක (ආයෝජිත සමාගම) සාමාන්‍ය කොටස්වල සිදුකරනු ලබන ආයෝජන

ඉහත (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ සඳහන් කරන ලද ආයෝජන, පහත දක්වා ඇති කොන්දේසිවලට යටත් වේ.

අ. එම ආයෝජනවල අරමුණ, පහත 2.i ඡේදයෙහි අර්ථ දක්වා ඇති පරිදි, විදේශයන්හි ව්‍යාපාර පුළුල් කිරීම විය යුතු ය.

ආ. එම ආයෝජන, පහත 2.ii ඡේදයෙහි අර්ථ දක්වා ඇති පරිදි, කළඹ ආයෝජන වලින් සමන්විත නොවිය යුතු ය.

ඇ. ආයෝජිත සමාගම තම ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත ලෙස ආයෝජන කටයුතු සිදු කරන සමාගමක් නොවිය යුතු ය.

ඈ. එම ආයෝජන ඉහත අ., ආ., සහ ඇ. යන ඡේද යටතේ සඳහන් කොන්දේසිවලට අනුකූල වන බව ආයෝජක සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා ආයෝජනවලට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමට අපේක්ෂිත බලයලත් වෙළෙන්ඳන් හට තහවුරු කළ යුතු ය.

(ඈ) පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත්කරන ලද රෙගුලාසිවලට අනුකූල ව, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති පාලිත සමාගමක හෝ විදේශීය කාර්යාලයක දැනටමත් සිදුකර ඇති ආයෝජනවලට අදාළ ව, එම රටෙහි පවතින නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා, සුදුසුකම් ලත් ආයෝජකයන් විසින් සිදුකරනු ලබන පසු කාලීන ආයෝජන

(ඉ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගමක් විසින් විදේශීය කාර්යාල පිහිටුවීම සඳහා, එ.ජ.ඩො. 100,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යාවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සිදු කරනු ලබන ආයෝජන

(ඊ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගමක් විසින් පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව, මෙම නියමය වලංගුවන දිනට පෙර පිහිටුවන ලද විදේශීය කාර්යාල සඳහා, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සිදු කරනු ලබන ආයෝජන

(උ) බලපත්‍රලාභී බැංකුවක් විසින් බැංකු මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ අරමුණ සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති පාලිත සමාගම්වල කොටස්වල සහ/හෝ විදේශීය කාර්යාලවල සිදු කරනු ලබන ආයෝජන

(ඌ) සුදුසුකම්ලත් නේවාසික තනි පුද්ගලයෙකු විසින් සේවක කොටස් හිමිකම් සැලැසුම්/සේවක කොටස් වරණීය ක්‍රම යටතේ සිදු කරනු ලබන ආයෝජන

iii. පහත 2.i ඡේදයෙහි අර්ථ දක්වා ඇති පරිදි, විදේශයන්හි ව්‍යාපාර පුළුල් කිරීමේ අරමුණ සඳහා, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ.ඩො. 200,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සීමා කරනු ලැබේ.

iv. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා සීමා කරනු ලැබේ.

v. 2021 අංක 1 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිත ව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන, එම ආයෝජන පහත දක්වා ඇති නිර්ණායක වලින් එකක් හෝ සපුරාලන අවස්ථාවල දී, එක් එක් ආයෝජනයේ යෝග්‍යතාව මත පදනම් ව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පනතෙහි 7 වන වගන්තියේ 10 වන උප වගන්තිය ප්‍රකාර ව, සළකා බලනු ලැබිය හැකි ය.

(අ) යෝජිත ආයෝජනය, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක සාමාන්‍ය කොටස්වල සිදු කරන ආයෝජනයක් විය යුතු අතර එම ආයෝජනය, ආයෝජක සමාගම විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් ලබාගන්නා ලද අවසරලත් විදේශ ව්‍යවහාර ණය මුදලකින් සම්පූර්ණයෙන් ම මූල්‍යනය විය යුතු අතර ඉහත සඳහන් ii වන උපඡේදයෙහි අ., ආ., ඇ. සහ ඈ. ලෙස දක්වා ඇති කොන්දේසිවලට යටත් ව සිදු කළ යුතු ය.

(ආ) යෝජිත ආයෝජනය, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජක සමාගම) විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක සාමාන්‍ය කොටස්වල සිදු කරන ආයෝජනයක් විය යුතු අතර, එම ආයෝජනය, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින්, කල්පිරීමේ කාලය අවම වශයෙන් වර්ෂ හතක් (7) වූ ආයෝජක සමාගම නිකුත් කරන ලද ණය සුරැකුම්පත්වල හෝ එම සමාගමේ කොටස්වල සිදුකරනු ලබන ආයෝජනවලින් ලද අරමුදල් වලින් සම්පූර්ණයෙන් ම මූල්‍යනය විය යුතු අතර ඉහත සඳහන් සඳහන් ii වන උපඡේදයෙහි අ., ආ., ඇ. සහ ඈ. ලෙස දක්වා ඇති කොන්දේසිවලට යත්ව සිදු කළ යුතු ය.

(ඇ) යෝජිත ආයෝජනය, පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කරන ලද රෙගුලාසිවලට අනුකූල ව, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති පාලිත සමාගමක හෝ විදේශීය කාර්යාලයක දැනටමත් සිදුකරන ලද ආයෝජනවලට අදාළ ව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා, සුදුසුකම්ලත් ආයෝජකයන් විසින් සිදු කරනු ලබන ආයෝජනයක් විය යුතු ය.

(ඈ) බලපත්‍රලාභී බැංකු විසින් බැංකු මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති පාලිත සමාගම්වල සහ/හෝ විදේශීය කාර්යාලවල සිදු කරනු ලබන ආයෝජන.

2. මෙම නියමයෙහි අරමුණු සඳහා,

i. "ව්‍යාපාර පුළුල් කිරීම" යන්නෙන්:

(අ) දැනට පවතින නිෂ්පාදන හෝ දැනට සපයන සේවාවලට සෘජුවම සම්බන්ධ වන ක්‍රියාකාරකම් පුළුල් කිරීම. නිෂ්පාදන/සේවා සැපයීමේ ධාරිතාව වැඩි කිරීම හෝ දැනට පවතින නිෂ්පාදන හෝ දැනට සපයන සේවාවල පරාසය පුළුල් කිරීම මෙයට ඇතුළත් වේ, සහ/හෝ

(ආ) සැපයුම්දාමය හරහා ක්‍රියාකාරකම් සිරස් ව ඒකාබද්ධ කිරීම්. මෙයට,

i. දැනට පවතින නිෂ්පාදන හෝ දැනට සපයන සේවා සඳහා භාවිතා වන අමු ද්‍රව්‍ය හෝ සංරචක සපයාගැනීමේ කාර්යයන්ට සෘජුවම සම්බන්ධ වන ක්‍රියාකාරකම් සහිත "පසුපසට ඒකාබද්ධ කිරීම්" සහ/හෝ

ii. දැනට පවතින නිෂ්පාදන හෝ දැනට සපයන සේවා, ගුදම් කිරීම, අලෙවිකරණය සහ සිල්ලර වෙළඳාම ඇතුළු ව බෙදාහැරීම් සඳහා සෘජුවම සම්බන්ධ වන ක්‍රියාකාරකම්වලට සීමා වෙමින්, අවසාන පාරිභෝගිකයාට වඩා සමීප ආයතන අත්පත් කරගැනීම හෝ එම ආයතනවල පාලනය ස්ථාපිත කිරීම සඳහා සම්බන්ධ වන ක්‍රියාකාරකම් සහිත "ඉදිරිපසට ඒකාබද්ධ කිරීම්",

යන අයිතමයන්ගෙන් එකක් හෝ ඇතුළත් වේ.

ii. "කළඹ ආයෝජන" යන්නෙන්, සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක සිදු කරන, එම ආයෝජකයන්ට, අදාළ සමාගමේ ඡන්ද බලයෙන් සියයට 10 කට අඩු ප්‍රතිශතයකට හිමිකම ලැබෙන පරිදි සිදුකරන ආයෝජන අදහස් වේ.

iii. "විදේශීය කාර්යාල" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති ශාඛා, සම්බන්ධීකරණ කාර්යාල, අලෙවිකරණ කාර්යාල, අනුයෝජිත කාර්යාල, ව්‍යාපෘති කාර්යාල, නියෝජිත කාර්යාල හෝ වෙනත් ඒ හා සමාන කාර්යාල අදහස් වේ.

iv. "බලපත්‍රලාභී බැංකුවක්" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථ දක්වා ඇති පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ.

3. මෙම නියමය, 2025 ජුනි 20 දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ. 2024 දෙසැම්බර් 19 දිනැති අංක 2415/56 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනවල පළකරන ලද නියමය, මෙම නියමය මගින් අවලංගු කරනු ලැබේ.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ජුනි මස 18 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.